# දක්ෂ නලුවෙක් වීම මගේ එකම බලාපොරොත්තුව

## SATHTHIWEL VINOTH

**ශ්‍රී සිද්ධාර්ථ ගෞතම, හුස්මක් තරමට, අහස් මාලිගා, මීදුම් කළුවර යන ටෙලි නාට්‍යවලටත් කවුරුවත් දන්නේ නෑ, ජීව, අප්පච්චි යන චිත්‍රපටවලටත් රංගනයෙන් දායකත්වය සපයා ඇති තවමත් 21 වන වියේ පසුවන තරුණයෙක් තමයි මෙවර ලංකායූත් චැට් සමගින් එකතු වන්නේ. නමින් සත්‍යවේල් විනෝද් වන ඔහු රත්මලාන ප්‍රදේශයේ පදිංචි තරුණයෙක් වන අතර ඔහු මේ වන විට වෙළඳ දැන්වීම් කිහිපයකට රංගනයෙන් දායක වෙලා තියෙනවා. මේ ඔහුගේ කතාවයි.**

**විනෝද්... කොහොමද? මොකද කරන්නේ මේ දවස්වල?**

හොඳයි... වරදක් නෑ... මේ දවස්වල රටේ පවතින කොවිඩ් තත්ත්වයත් සමග පුළුවන් විදිහට වැඩකටයුතු කරගෙන ඉන්නවා.

**අපි කැමැතියි ඔබ කවුද? මොනවද කරන්නේ කියලා දැනගන්න.**

මම සත්‍යවේල් විනෝද්. මම දැනට රංගන ක්ෂේත්‍රයේ වැඩකටයුතුවල නිරත වී සිටිනවා. ඒ වගේම මේ දවස්වලට ගෙදරට වෙලා ඉන්නවා.

**ඒ වගේම ඔයාගේ පෞද්ගලික තොරතුරු ටිකක් දැනගන්නත් අපි කැමැතියි.**

මම රත්මලාන ප්‍රදේශයේ ජීවත් වෙන්නෙ. මේ වෙද්දි



මට වයස අවුරුදු 21ක් වෙනවා. මම පාසල් ගියේ බප/පිළි/කොතලාවලපුර මහා විද්‍යාලයටයි.

**පවුලේ විස්තර මොනවද?**

මගේ පවුලේ අම්මයි, තාත්තයි, අක්කලා දෙන්නයි මමයි තමයි ඉන්නේ. අක්කලා දෙන්නා නම් මේ වෙද්දි විවාහකයි.

**ඔබ ප්‍රධාන වශයෙන් නියෝජනය කරන්නේ කුමන ක්ෂේත්‍රයක්ද? ඒ ගැන කියමුද?**

මම මූලික වශයෙන්ම නියැලෙන්නේ රංගන ක්ෂේත්‍රයේ. ඒ වගේම නර්ථන කටයුතුවලද නියැලෙනවා.

**රංගනයට යොමුවන්නේ කුමන කාලයේදීද? කෙසේද?**

2019දී මම කලා කටයුතු ආරම්භ කළා. සිසිර සොයුරා විසින් මාව රංගනය පිළිබඳ වූ සංසදයකට යොමු කළා. ඒ මාර්ගයෙන් ශ්‍රී සිද්ධාර්ථ ගෞතම ටෙලි නාට්‍යයේ රංගනයකට අවස්ථාව ලැබුණා.

**මේ වන විට රංගනයෙන් දායක වී ඇති දෑ ගැන කිව්වොත්...**

ශ්‍රී සිද්ධාර්ථ ගෞතම, හුස්මක් තරමට, අහස් මාලිගා, මීදුම් කළුවර යන ටෙලි නාට්‍යවල සහ කවුරුවත් දන්නේ නෑ, ජීව, අප්පච්චි යන චිත්‍රපට සහ වෙළඳ දැන්වීම් කිහිපයකට රංගනයෙන් දායක වෙලා තියෙනවා.

**ඒ වගේම ඉදිරියේදී කුමන නිර්මාණවලින්ද දැකගන්න පුළුවන් වෙන්නේ.**

සිහින සමීකරණ ටෙලි නිර්මාණය සහ කොඩි ගහ යට ටෙලි නාට්‍ය ඉදිරියේදී විකාශය වීමට නියමිතයි.

**ඔබ කලා පදනමක් නියෝජනය කරනවා. ඒ ගැනත් කියමුද?**

ඔව්... මම රෑන ක්‍රියේෂන් කලා සංසදයේ කාරක සභිකයෙක්. සභාපති සිසිර සොයුරා සමග එහි ආරම්භයේ සිටම මා කටයුතු කරනවා.

**කොහොමද කිසියම් අයෙක් ඊට එකතු වෙන්නේ.**

0717 183 470 කියන වට්ස්ඇප් අංකය හරහා සභාපති සිසිර මහතා ඇමතීමෙන් රෑන ක්‍රියේෂන් වෙත සම්බන්ධ වෙන්න පුළුවන්.

**මේතාක් පැමිණි කාලය තුළ ඔබ ලැබූ අත්දැකීම් ගැන සඳහන් කළොත්.**

මා මේ වන විට වසර දෙක හමාරක් පමණ කාලයක් කලා ක්ෂේත්‍රයේ නියැලෙනවා. ඉතින් අත්දැකීම් නම් හුඟක් තියෙනවා. මං කලා කටයුතුවලට සම්බන්ධ වෙද්දි කිසිදෙයක් පිළිබඳ දැනුමක් තිබ්බේ නෑ. ඒ වගේම මගේ







නෑදෑයෝ ඔය පිස්සු වැඩ කරන්ඩ එපා කිව්වා. ඒත් මම සැලුනේ නෑ.

**මේ ගමනට උදව් උපකාර කරන්නේ කවුද?**

මගේ අම්මා, තාත්තා මට හුඟක් උදව් කරනවා. ඒ වගේම රෑන ක්‍රියේෂන් සභාපති සිසිර මහතා ඇතුළු මගේ සහෝදර කැල, ඒ වගේම මගේ මිතුරන් මට කලා කටයුතුවලට සහයෝගය ලබාදෙනවා.

**අවසන් වශයෙන් මොනවද ඉදිරි බලාපොරොත්තු සහ ඔබ සම්බන්ධ කර ගන්නේ කෙසේද?**

ලංකාවේ දක්ෂ නලුවෙක් වීම මගේ එකම බලාපොරොත්තුවයි. ඒ නරක පැත්තෙන් නෙවෙයි අවංක හා යහපත් දේ තුළින්. ඒ වගේම රෑන ක්‍රියේෂන් ලංකාවේ කලාකරුවන් අතර ප්‍රචලිත වීම මගේ ආසාවයි.

076 993 2352 යන දුරකථන අංකය හාරහා මාව සම්බන්ධ කර ගන්න පුළුවන්.

අනුර ප්‍රේමකුමාර
පිටුසැකසුම
Lankayouth.com

මෙවැනි ලිපියක් ලංකායූත් වෙබ් අඩවියේ පළ කරගැනීමට ඔබත් කැමැතිනම් 0718 548 549 වට්ස්ඇප් අංකයට කතා කරන්න.